තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

**හාජරා කාසිම් එ. අධ්‍යාපන අමාත්‍යාංශය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1439/2019 (2019.10.21) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.
**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - හාජරා කාසිම්
**නොතිසි ලත් පාර්ශවය**- නම් කළ නිලධාරී**,** අධ්‍යාපන අමාත්‍යාංශය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.30 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.23 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2019.03.21 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.04.20 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.10.30 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

තෝරා ගත් ලේඛනය හා මුස්ලිම් කාන්තා විදුහල සම්බන්ධ තොරතුරු

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.11.23 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2019.03.21 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ අදාළ තොරතුරු ලබා දිය හැකි බවයි. මෙම තීරණයෙන් ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2019.04.20 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

කලින් මෙම කරුණ විභාග කොට (2018.12.20) නියෝගයක්ද දී ඇත. නැවතත් එම කරුණම වෙනත් අංකයකින් විමසා ඇත. කලින් අංකය (994/2019) ඉල්ලීම 2018 ජූලි 03 අවසන් කර ඇත. ඒ අනුව මෙම ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමට තීරණය වේ. ගොනුවේ කටයුතු අවසන් වේ.

**නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.